**ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජුලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නළ ජල සේවා සහ වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම හා සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන එජඩො මිලියන 183.9 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එජඩො මිලියන 165 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. රු.මිලියන 2,840 ක් වූ ඉතිරි වටිනාකම ශ්‍රී ලංකා රජය හා ප්‍රජා දායකත්වය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කොට තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ වගුව 2 හි විස්තර වන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

විගණනයෙහි කොටසක් වශයෙන් මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනයට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. මිලියන | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | මූල්‍ය ගිවිසුමේ ඡේද අංක 2.04 හා 2.05 ප්‍රකාරව ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කළ යුතු සමාලෝචිත වර්ෂයේ දී ණය නියෝජිත ආයතනය විසින් අයකර ගන්නා ලද පොලී සහ සේවා ගාස්තු ගිණුම් ගත කොට නොතිබුණි. | 199.17 | රජයේ දායකත්වය අවප්‍රමාණය වීම. | අවශ්‍ය ගැලපීම් 2019 දී සිදු කරනු ඇත. | ව්‍යාපෘතියේ මුළු පිරිවැය පිළිබිඹු වන පරිදි දෝෂය නිවැරදි කිරීමට පියවර ගත යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේ ණය මුදල් නිදහස් කිරීමෙන් ලද ලැබීම් ණය දෙන නියෝජිත ආයතනයෙන් ලද අත්තිකාරම් ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. | 1,670.31 | ණය ශේෂය අවප්‍රමාණය වීම. | නිවැරදි කිරීමේ ප්‍රවේශය 2019 දී සිදු කරනු ඇත. | ඉදිරි වර්ෂවලදී එවැනි දෝෂයන් වළක්වා ගැනීමට පියවර ගත යුතු වීම. |
| (ඇ) | ග්‍රාමීය සහ වතු ජල සම්පාදන යෝජනා ක්‍රම, පුනරුත්ථාපන ජල සම්පාදන යෝජනා ක්‍රම සහ නාගරික සනීපාරක්ෂක යෝජනා ක්‍රම යනාදිය යටතේ දරන ලද සංවර්ධන පිරිවැය ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය හා වතු සනීපාරක්ෂක වැඩසටහන් සඳහා වන සංවර්ධන පිරිවැය ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. | 97.67 | සනීපාරක්ෂක යටිතල පහසුකම් සඳහා වන සංවර්ධන වියදම් අධිප්‍රමාණය වීම. | 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | ව්‍යාපෘතියේ වියදම් වර්ගීකරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. |

**2.2 සැසඳුම් නොකළ ශේෂ**

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ එකතු වටිනාකම රු. මිලියන 4.72 ක් වන කෑගල්ල, මුලතිව් සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි පරිගණක හා උපකරණ, කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ හා සවිකිරීම්හි පිරිවැය ඊට අනුරූප ලෙස | වත්කම්වල පැවැත්ම සහ තක්සේරුව සනාථ කර ගත නොහැකි විය. | 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | අනුරූප වාර්තා සමඟ කාලීනව ශේෂයන් සැසඳුම් කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.මිලියන 5.27 ක වටිනාකම සමඟ එකඟ නොවීය. | | | |
| (ආ) | ව්‍යාපෘතියේ කිලිනොච්චි දිස්ත්‍රික් සභය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවල දැක්වෙන පිළිවෙලින් ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති සහ ප්‍රතීක ප්‍රතිකාගාර පිරියත යටතේ වන 2018 දෙසැම්බර් 31 දිනට වූ රු. මිලියන 1.49 ක සහ රු.මිලියන 18.82 ක සහතික කරන ලද සිවිල් වැඩ වටිනාකම ඊට අනුරූප ලෙස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. මිලියන 8.31 සහ රු.මිලියන 11.66 ක සහතික කරන ලද සිවිල් වැඩ වටිනාකම් සමඟ එකඟ වී නොතිබුණි. | -එම- | 2019 වර්ෂයේ දී අවශ්‍ය ගැලපුම් සිදු කෙරේ. | අභ්‍යන්තර වාර්තාවන් කාලීනව සැසඳුම් කිරීම සඳහා පාලනයන් ශක්තිමත් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය**

නාගරික, ග්‍රාමීය හා වතු ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනුරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය වර්ධනය කිරීම හා ජලයේ ගුණත්වය සැලසුම් කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යනාදී වශයෙන් සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් නුවරඑළිය, කෑගල්ල, කිලිනොච්චි, මුලතිව්, රත්නපුරය, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කෙරේ. පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධනය | | ප්‍රමාද දින ගණන | බලපෑම | ප්‍රමාද වීමට හේතු | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත % | සත්‍ය % | | | | |
| **ග්‍රාමීය හා ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම** | | | | | | |
| නවකඩදොර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 92 | 43 | 60 | අපේක්ෂිත ප්‍රතිඵල කරා කාලීනව ළඟා නොවනු ඇත. | මුදල් අනුපාතයන්හි පිරිවැය ඉහළ යාම, දේශීය වාණිජ බැංකු විසින් අයිරා පහසුකම් කප්පාදු කිරීම හේතුවෙන් පයිප්ප හා උපාංග ආනයනය කිරීම හා සැපයීම ප්‍රමාද වීම් වැනි හේතු | ව්‍යාපෘති කටයුතු කාලීනව නිම කිරීමට හැකිවන පරිදි මහා භාණ්ඩාගාරයේ උපදෙස් ඇතිව කොන්ත්‍රාත්කරුවන්ට සහන ලබා දීමට ක්‍රියාත්මක කිරීමේ |
| මතුරට වැටකෙපොත ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 85 | 334 | | | |
| එඩින්බර්ග් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 45 | 28 | | | |
| රැකිට්පේ ජල සම්පාදන යෝජනා ක්‍රමය | 91 | 91 | 294 | | | |
| මන්ත්‍රීතැන්න ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 67 | 387 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ලින්ඩ්සේ පහළ ජල සම්පාදන යෝජනා ක්‍රමය | 55 | 03 | 251 | සිවිල් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාදයට හේතු වී තිබේ. | නියෝජිත ආයතනය විසින් ඉක්මන් පියවර ගත යුතු වීම. |
| අංහෙට්ටිගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 76 | 381 | | |
| දෙයියන්වල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 89 | 210 | | |
| මියනවිට ජල සම්පාදන යෝජනා ක්‍රමය | 70 | 18 | 81 | | |
| හක්බෙල්ලාවක ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 65 | 57 | | |
| කීරිහේන ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 17 | 92 | | |
| තැලිගම ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 30 | 322 | | |
| පොන්නගර් පාර්තිපුරම් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 73 | 20 | 72 | | |
| තොඩ්ඩුවාන්කුඩි ජල සම්පාදන යෝජනා ක්‍රමය | 75 | 62 | 205 | | |
| මලයාලපුරම් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 46 | 34 | 60 | | |
| කිලිනොච්චි ප්‍රතික ප්‍රතිකාරක පිරියත | 100 | 40 | 420 | | |
| පුදුකුඩුඉරිප්පු ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 33 | 50 | | |
| ඔඩ්ඩුසුඩාන් ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 78 | 199 | | |
| මුල්ලතිව් ප්‍රතික ප්‍රතිකාරක පිරියත | 100 | 31 | 410 | | |
| වැලිපොතයාය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 90 | 207 | | |
| මාදම්පේ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 70 | 86 | | |
| දොඹගස්වින්න ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 72 | 102 | | |
| අඹගහයාය ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 75 | 17 | | |
| දූරකන්ද ආශ්‍රිත ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 85 | 22 | | |
| සූරියආර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 84 | 293 | | |
| බෙල්ලන්ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 80 | 42 | 91 | | |
| පීල්ලෙකඳුර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 73 | 24 | 365 | | |
| කරාඳුගල ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 65 | 182 | | |

| | | | |
|---|---|---|---|
| ඉත්තැකටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 35 | 25 | 22 |
| මාරිඅරාව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 100 | 55 | 60 |
| සමගිපුර ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 70 | 45 | 170 |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිපොතයාය ජල සම්පාදන යෝජනා ක්‍රමය 2018 ජුනි 20 දින අවසන් කරන ලදී. ඉතිරි කටයුතු සම්පූර්ණ කිරීමේ කොන්ත්‍රාත්තුව කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට භාර දී ඇති අතර නල සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් 2019 මැයි 31 වන විටත් එය අවසන් කර නොතිබුණි. | i) කොන්ත්‍රාත්තුවේ පිරිවැය ඉහළ යාමට ඇති හැකියාව.<br>ii) නිදහස් කරන ලද සංචලන අත්තිකාරම් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය නොකොට දීර්ඝ කාලයක් මුළුල්ලේ කොන්ත්‍රාත්කරුවන් විසින් රඳවා ගනු ඇත. | මෙම කොන්ත්‍රාත්තු දෙක අවසන් කර ඇති අතර දෙවන කොන්ත්‍රාත්කරු වැඩ කටයුතු කරගෙන යන අතර එය 2019 අගෝස්තු මස අවසන් කළ හැකිය. | කාල රාමුව තුළ වැඩ නිම කිරීම සඳහා කාර්යයන් නිතිපතා අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | 2018 දෙසැම්බර් 02 දින අවසන් කිරීමට නියමිතව තිබූ නුවරඑළිය දිස්ත්‍රික්කයේ එඩින්බරග් ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා වන කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 31 වන විට සියයට 45 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. තවද, එතැන් සිට 2019 අප්‍රේල් මස අවසානය දක්වා කොන්ත්‍රාත්කරු විසින් කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණු අතර රු. මිලියන 8.84 ක සංචලන අත්තිකාරම වසරකට වඩා වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි. | -එම- | ව්‍යාපෘති ප්‍රගතිය මේ වන විට සියයට 80 කි. නිවාස සම්බන්ධතා කටයුතු සිදුවෙමින් පවතී. 2019 නොවැම්බර් 15 වන විට වැඩ අවසන් කළ හැකිය. | -එම- |
| (ඇ) | කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි පිහිටි ප්‍රතික ප්‍රතිකාගාර පිරියත ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව, කොන්ත්‍රාත් දිනයේ සිට පිළිවෙලින් මාස 09 කින් සහ මාස 06 කින් අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණද, මාස 20 ක ප්‍රමාදයකින් පසුවත් එය අවසන් කොට නොතිබුණි. රු.මිලියන 14.8 ක අත්තිකාරම් මුදල් රඳවා ගැනීමට ඉඩහරිමින් අවස්ථා 03 කදී කාලදිගුවන් ලබා දී තිබුණි. | -එම- | ණය නියෝජිත ආයතනයේ මැදිහත්වීම සහ බැම්ම සඳහා සුදුසු පාංශු ද්‍රව්‍ය හිඟය සහ අහිතකර දේශගුණ තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | කොන්ත්‍රාත්තුව යටතේ කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණද, මොණරාගල දිස්ත්‍රික්කයේ බෙල්ලන්ඔය, ඉත්තැකටුව, පීල්ලෙකදුර ජල සම්පාදන සහ මාරිඅරාව ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට කාල දිගුවන් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2019 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඉ) | ව්‍යාපෘතියේ මූලික සැලසුම්වලට අනුව, ඉහත දිස්ත්‍රික්ක 07 තුළ ව්‍යාපෘතිය මගින් වැසිකිළි 14,306 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ වසර 03 මෙහෙයුම් කාල පරිච්ඡේදයකින් පසුව වැසිකිළි 8,084 ක පමණක් ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. තවද, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට නියමිතව තිබූ වැසිකිළි 1164 න් සමාලෝචිත වර්ෂය අවසානයට වැසිකිළි 724 ක් පමණක් ඉදිකර තිබුණි. | -එම- | වැසිකිළි ඉදිකිරීමේ ප්‍රගතිය, ඉල්ලුමට හේතු වන සාධක සහ ප්‍රජා ප්‍රතිචාරයන් මත රඳා පවතී. එබැවින් මූලික ක්‍රියාවලිය වෙනස් කිරීමට සහ සනීපාරක්ෂක සංරචකය ප්‍රතිව්‍යූහගත කිරීමට පියවර ගෙන ඇත. | |

### 3.3 වැඩබිම් පරීක්ෂාවන්හිදී සිදුකළ නිරීක්ෂණයන්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| දොඹගස්වින්න ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රයෝජනය සඳහා මිලට ගත් රු.880,866 ක් වටිනා පීවීසී නල මීටර් 8800 කින් මීටර 2347.38 ක් පමණක් උපයෝජනය කොට තිබුණි. එම භාවිතයට නොගත් නල ප්‍රජා පරිශ්‍රයන් ඇතුළුව ස්ථාන කිහිපයක කිසිදු ආරක්ෂාවකින් තොරව ගබඩා කොට තිබුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සොරකම් කිරීම සහ අනිසි ලෙස භාවිතා කිරීම හේතුවෙන් වත්කම්වලට අලාභ සිදුවිය හැකි වීම. | පිවිසුම් මාර්ග නොමැතිකම හේතුවෙන් මෙය ව්‍යාපෘතියේ ඉතා දුෂ්කර වැඩබිමක් වේ. කාර්යයන් ඉක්මනින් නිම කිරීම සඳහා පියවර ගනු ඇත. | ද්‍රව්‍යවල ආරක්ෂාව සහතික කළ යුතු වීම. |

### 3.4 ඌනඋපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් 2018 දෙසැම්බර් 31 දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති වෙත රු.මිලියන 35,145 ක මුදලක් නිදහස් කර තිබුණු අතර වැසිකිළි ඉදිකිරීම සඳහා | අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව. | වතු ආශ්‍රිත ප්‍රදේශයන්හි අරමුදල් ගලායාමේ යාන්ත්‍රණය වනුයේ වතු කම්කරුවන්ගේ සමුපකාර සමිතිවලට සහ වතු කම්කරුවන්ගේ සමුපකාර සමිතියේ සිට ප්‍රතිලාභීන් වෙත | සමුපකාර සමිති අත ඇති අරමුදල් අදාළ ප්‍රතිලාභීන්ට බෙදා හැරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | රු.මිලියන 28.20 ක මුදලක් ප්‍රතිලාභීන් අතරේ බෙදා දී තිබුණි. එබැවින්, අපේක්ෂිත අරමුණු සඳහා යෙදවීමකින් තොරව රු.මිලියන 4.41 ක මුදලක් වසරකට වඩා වැඩි කාලයක් සමුපකාර සමිති අතෙහි රඳවා ගෙන තිබුණි. තවද, වතු අංශය සඳහා ක්‍රියාත්මක කිරීමේ සහය ලබා ගැනීමේ අරමුණින් ව්‍යාපෘතිය විසින් වතු මානව සංවර්ධන භාරය සමඟ ගිවිසුමකට එළඹී තිබූ අතර එම ගිවිසුම 2017 ජූනි 30 දින කල් පිරී තිබුණි. | | ප්‍රතිපාදන නැවත වෙන් කිරීමයි. අරමුදල් ගලායෑමේ යාන්ත්‍රණය අධ්‍යයනය කිරීමේදී මීට පෙර ව්‍යාපෘතින්හි වතු ප්‍රතිලාභීන්ට බෙදා හරින ලද මුදල් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර සිටීමේ දැඩි අවදානමක් පැවති බව සොයා ගන්නා ලදී. මෙම අවස්ථාවේදී වතු කම්කරුවන්ගේ සමුපකාර සමිති ඔවුන්ගේ කොන්ත්‍රාත්කරුවන්ගේ පදනම හරහා ඉදිකිරීම් සිදු කිරීමට භාරගන්නා ලදී. | හෝ අයකර ගැනීමට ක්ෂණික පියවර ගත යුතු වීම. |
| (ආ) | රු.මිලියන 4.23 ක මුදලකට මිලදී ගන්නා ලද මෝටර් වාහන 03 ක් දිස්ත්‍රික් සහය ඒකකය විසින් මානව සංවර්ධන භාරය වෙත සමාලෝචිත වර්ෂය තුළ දී ලබා දී ඇතිව බව නිරීක්ෂණය විය. කුලී පදනම මත ලබාගත් වෙනත් මෝටර් වාහන 06 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සහ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. | ව්‍යාපෘතියේ දේපල බාහිර පාර්ශවයන්ට භාවිතා කිරීමට අවස්ථාව සලසා දීම. | ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් වෙත මෝටර් රථ මුදා හැර තිබුණි. | ව්‍යාපෘතියට අයත් වත්කම් පරිහරණය අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු වීම. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක චක්‍රලේඛ 01/2016 ට පටහැනිව පිටස්තර ආයතනවල සේවකයින් 119 දෙනෙකු ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා තිබූ අතර රු. මිලියන 59.20 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. තවද ඉහත සේවකයින් අතුරින් සේවකයින් 40 දෙනෙකු ප්‍රමාණ සමීක්ෂක, ගෘහ නිර්මාණ ශිල්පීන්, වැඩබිම් අධීක්ෂක සහ ගිණුම් ලිපිකරු යනාදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරු 08 ක් සඳහා සේවයේ යොදවා තිබුණි. | වේතන සහ වෙනත් දීමනා ගෙවීම සම්බන්ධ පාලනයන් දුර්වල විය හැකිය. | මෙම ව්‍යාපෘතිය උප ව්‍යාපෘති 120 ක් සහ පුනරුත්ථාපන ව්‍යාපෘති 200 ක් සැලසුම් කිරීමෙහි නිරත වේ. සනීපාරක්ෂක සංරචකය මත නැවත ප්‍රතිපාදනයන් වෙන් කිරීම හේතුවෙන් පොදු පහසුව සඳහා මධ්‍යස්ථාන 07 ක්, පාසල් සනීපාරක්ෂක කටයුතු 42 ක්, කාන්තාවන් මුල්කරගත් සනීපාරක්ෂක කටයුතු 400 ක් සහ විවිධාකාර සනීපාරක්ෂක කටයුතු 100 කට අධික ප්‍රමාණයක් සැලසුම් කිරීමට ව්‍යාපෘතියට සිදුවිය. මින් සමහරක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේදී හඳුනාගෙන නොතිබුණි. එබැවින් වරින් වර, අතිරේක කාර්ය මණ්ඩල | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවශ්‍යතාවයන් ණය නියෝජිත ආයතනය විසින් හඳුනාගෙන තිබුණි. | |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනි ලෙස රේඛීය අමාත්‍යාංශයේ වැඩසටහන් නිලධාරීන් 02 දෙනෙකු අර්ධ කාලීනව ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත මුදා හැර තිබුණි. තවද, ඉහත තනතුරේ කිසිදු නිලධාරියෙකු ව්‍යාපෘති කටයුතුවලට ක්‍රියාකාරීව සහභාගී නොවන බව නිරීක්ෂණය විය. | එය විනිවිදභාවය නැති වීමට හේතු වේ. | ඔවුන් ව්‍යාපෘති වැඩබිම්වලට සම්බන්ධ වන අතර ව්‍යාපෘති වැඩසටහන් පිළිබඳ වාර්තා ඉදිරිපත් කරයි. | අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු වීම. |